පුරවැසි සංවාද
(අංක 02)

# දින 50 : උමඟ කෙළවර ආලෝකය ද?

## (2018 ඔක්තෝබර් 26-දෙසැම්බර් 15 දේශපාලන චලනයන් පිළිබඳ ජනතා අදහස් විමසුමක්)

විදුර ප්‍රභාත් මුණසිංහ

LAW & SOCIETY TRUST

# දින 50 : උමඟ කෙළවර ආලෝකය ද?

(2018 ඔක්තෝබර් 26-දෙසැම්බර් 15 දේශපාලන චලනයන්
පිළිබඳ ජනතා අදහස් විමසුමක්)

විදුර ප්‍රභාත් මුණසිංහ

**දින 50 : උමඟ කෙළවර ආලෝකය ද?**

**(2018 ඔක්තෝබර් 26-දෙසැම්බර් 15 දේශපාලන චලනයන් පිළිබඳ ජනතා අදහස් විමසුමක්)**


© නීතිය හා සමාජ භාරය, 2019

මෙම පඨිතයේ අන්තර්ගතය හෝ එහි කොටස් වාණිජ්‍යය නොවන පරමාර්ථයන් සඳහා පමණක් උපුටා ගැනීම හා පිටපත් කිරීමට ලේඛනය හා එහි ප්‍රකාශක නියමාකාරයෙන් හඳුන්වා දීමෙන් අනතුරුව සිදු කිරීමට අවසර ඇත.



විදුර ප්‍රභාත් මුණසිංහ



කවරය හා පිටු සැකසුම : ප්‍රභාත් හේමන්ත කුමාර

ප්‍රකාශක :

LAW & SOCIETY TRUST

**නීතිය හා සමාජ භාරය,**
3, කින්සි ටෙරසය,
කොළඹ 00800,
ශ්‍රී ලංකාව
දුරකථනය : +94 (0) 11 268 48 45
ෆැක්ස් : +94 (0) 11 2686843
වෙබ් : www.lstlanka.org

# දින 50 : උමඟ කෙළවර ආලෝකය ද?

## (2018 ඔක්තෝබර් 26-දෙසැම්බර් 15 දේශපාලන චලනයන් පිළිබඳ ජනතා අදහස් විමසුමක්)[1]

විදුර ප්‍රභාත් මුණසිංහ[2]

### හැඳින්වීම

දිනය : 2018 ඔක්තෝබර් 26 දින,

අප තිදෙනෙකු මොණරාගලින් කොළඹ බලා පිටත් වූයේ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුත්තක් නිමවීමෙන් පසු දහවල් 1.00 ට පමණය. අප තිදෙනාගේම බැටරි ක්‍රියා විරහිතව දුරකථන අක්‍රීයව තිබූ අතර අප ගමන් ගත් වාහනයේ රේඩියෝව ද ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ගමන පුරා අප තිදෙනාම පාහේ වැඩි කාලයක් ගත කළේ නින්දේය. රාත්‍රී 7.15 ට පමණ නුගේගොඩින් අපගේ

---

1. මෙම වියවුල් සහගත දේශපාලනික මොහොත තුළ ජනතා ප්‍රතිචාර හා අදහස් එක්රැස් කිරීම වැදගත්ය යන මූලික අදහස ඉදිරිපත් වූයේ නීතිය හා සමාජ භාරයේ විධායක අධ්‍යක්ෂිකා සකුන්තලා කදිර්ගාමර් වෙතිනි. මසක පමණ කෙටි කාලයක් තුළ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා මාලාව යථාර්ථයක් කරගැනීමට නීතිය හා සමාජ භාරයේ කාර්ය මණ්ඩලයේ පී. එම්. සේනාරත්න, අනුරාධි ජයසිංහ, තර්මිකා සෙල්වරාජ්, සම්රුත් ජෙහාන්, විජේකාන්ත් මාඩසාමි, ඉමේෂා පෙරේරා, කෞශල්‍යා ආරියරත්න, නටාෂා වැන්හොෆ් යනාදීන් විසින් ලබාදුන් සහයෝගයට ස්තුතිවන්ත විය යුතුය. දිවයිනේ දිස්ත්‍රික්ක විශාල ගණනක සංචාරය කරමින් දීර්ඝ සම්මුඛ සාකච්ඡා මෙහෙයවූ සහ දත්ත විශ්ලේෂණයෙන් සහාය වූ නීතිය හා සමාජ භාරයේ පර්යේෂණ සහායකයින් වන ප්‍රභාත් හේමන්ත කුමාර, මාලිංග ජයරත්න, ඉෂාන් චාමර බටවලගේ සහ ලක්ෂාන් අබේවර්ධන යන අයගේ විශිෂ්ට කැප කිරීම වෙනුවෙන් ඔවුන් වෙත සුවිශේෂී කෘතඥතාවයක් හිමිවිය යුතුය. මෙම ක්‍රියාවලිය තුළ නීතිය හා සමාජ භාරයේ මෙහෙයුම් හා වැඩසටහන් අධ්‍යක්ෂක සඳුන් තුඩුගල විසින් ලබාදුන් විචාරාත්මක සහයෝගය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි. එනයින් මෙම පර්යේෂණය සැබැවින්ම සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.

2. විදුර ප්‍රභාත් මුණසිංහ නීතිය හා සමාජ භාරයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකු වශයෙන් කටයුතු කරයි.

පළමුවැන්නා වාහනයෙන් බසිත්ම ඔහුගේ නිවස ඉදිරිපිට සිටි අයෙකු කී පුවත විශ්වාස කිරීමට අපට බොහෝ වේලාවක් ගත විය. එනම් මහින්ද රාජපක්ෂ මහතා අගමැති ධූරයේ දිව්රුම් දුන් බවයි. වඩා උනන්දුවෙන් වටපිට නිරීක්ෂණය කිරීමේදී අපට පෙනී ගියේ සෑම නිවසකම, වෙළඳසැලකම පාහේ රූපවාහිනී යන්ත්‍ර තුළින් ජනතාව මෙම පුවත නරඹන ආකාරයත්, ඉඳහිට තැනක කිහිපදෙනා බැගින් එකතු වී රතිඤ්ඤා දල්වන ආකාරයත්ය. අප මොණරාගලින් පිටත් වන විට හදිසි ආණ්ඩු මාරුවක ඡායා මාත්‍රයක් හෝ නොතිබූ අතර අප බාහිර ලෝකයේ සන්නිවේදනයන්ගෙන් මිදී ගතකළ පැය කිහිපය තුළ සියල්ල වෙනස් වී තිබිණ. නියමිත පරිදි කටයුතු සිදුවූයේ නම් ආණ්ඩු මාරුවක වියහැකියාව පැවතුනේ අවම වශයෙන් මීට වසර එකහමාරකට පසු කාලයකය.[3] බාහිර ලෝකයේ සන්නිවේනදයන් නොමැතිව අප පැමිණි පැය කිහිපය, කාලය හරහා රික්තක නලයක අනාගතය කරා ගමන් කිරීමක් වැනි අත්දැකීමක් වී යැයි පසුආවර්තිතව අද දින අපට සිතෙයි.

එකී ඔක්තෝබර් 26 දින සිට අද දින[4] දක්වා ගතවූ දින 50 කට ආසන්න කාලය තුළ මෙරට දේශපාලන, ආර්ථික, නෛතික හා සමාජයීය ක්ෂේත්‍රයන් හි විවිධ හැලහැප්පීම් සිදුවූ අතර එකී සිදුවීම් විසින් දේශපාලනය සම්බන්ධයෙන් මෙරට ජනතාව තුළ වඩාත් සක්‍රීය සංවාදයක් නිර්මාණය කිරීමට සමත් විය. මෙකී සංවාදයන් තුළ

---

3. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ ධූර කාලය වසර 5ක් වන අතර අවසන් වරට මහා මැතිවරණයක් පවත්වා තිබුණේ 2015 අගෝස්තු 17 වන දිනය. ඒ අනුව වර්තමාන පාර්ලිමේන්තුවේ ධූර කාලය අවසන් වීමට නියමිතව තිබුණේ 2020 අගෝස්තු 16 වන දිනය. 1978 ව්‍යවස්ථාවට සිදු කරන ලද 19 වන සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරවාලිය හැක්කේ පාර්ලිමේන්තුවේ ධූර කාලයෙන් වසර හතරහමාරක් ගතවීමෙන් අනතුරුව පමණි.

4. මෙම ලිවීම ලියන ලද්දේ 2018 දෙසැම්බර් 08-15 අතර කාලයේදීය.

විවිධ මට්ටම් වලින් ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා පරමාධිපත්‍යය, නීතියේ පාලනය, සමාජ සම්මුතිය, දේශපාලන සදාචාරය යනාදී විවිධ සංවාද තලයන් ගැබ්වී තිබිණ. ස්වකීය සමාජ දේශපාලනික අවබෝධය කවර තරාතිරමක එකක් වුවද ජනතාව සෑම කල්හිම මෙකී මාතෘකාවන් සම්බන්ධයෙන් විචාරාත්මක වන්නේය යන්න අප කිසිවෙකුට බැහැර කළ හැක්කක් නොවේ. නමුත් එකී සංකල්ප සමග ඔවුන්ගේ වන ගණුදෙනුව හා ඒ පිළිබඳව වන ඔවුන්ගේ දැක්ම මනාව නිරූපණය වන්නේ දේශපාලනික කැළඹිලිකාරීත්වයන්ගෙන් තොර කාලවකවානු වලදී නොව සංකීර්ණ සමාජ දේශපාලන චලනයන් තමා අභිමුවේ සිදුවන, තමන් ද එහි බලපෑමට ලක්වන මොහොතේදීය යන්න අවිවාදිතය. ඒ අර්ථයෙන් ගෙවී ගිය මාස එකහමාරක පමණ කාලය මෙරට ජනතාව ඉහත කී වියුක්ත සංකල්පයන් සම්බන්ධයෙන් සක්‍රිය ලෙස තම සිතීම අවදි කළ, එමෙන්ම ඒ සම්බන්ධයෙන් විවිධාකාර මැදිහත්වීම් කළ කාලවකවානුවකි. අපගේ මෙම පර්යේෂණයේ අරමුණ වූයේ මෙවන් දේශපාලනික කැළඹිලිකාරී මොහොතක ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා පරමාධිපත්‍යය පිළිබඳව ජනතාව කල්පනා කරන්නේ කෙසේද යන්න විමසා බැලීමයි.

අනෙක් අතට සීඝ්‍රයෙන් වෙනස් වන සංසිද්ධිදාමය තුළ වෙනස් වන ජනතාවගේ අදහස් වල කාලිකත්වය තහවුරු කරගනු පිණිස ඉතා වේගවත්ව දත්ත එක්රැස් කිරීමත්, දත්ත විශ්ලේෂණය කිරීමත් කළ යුතුව තිබිණ. ඒ අනුව මෙකී දත්ත එක්රැස් කිරීම ආන්දෝලනාත්මක සිද්ධිදාමයට මුලපිරූ 26 දින සිට දින තුනකින් එනම්, ඔක්තෝබර් 29 දිනෙන් ආරම්භ කොට හරියටම මාසයක කාලයක් තුළ නිම කිරීමට අප විසින් කටයුතු කරන ලදී. මේ සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක 22ක විවිධ තරාතිරමේ කාන්තාවන් සහ පිරිමින් 143 ක් දීර්ඝ සම්මුඛ සාකච්ඡාවන්ට අප විසින් ලක් කෙරිණ. එකී 143 දෙනා බොරැල්ල, තලවතුගොඩ, බම්බලපිටිය, කිරිබත්ගොඩ, පානදුර, රත්‍නපස්වල, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, යාපනය, මුලතිවු,

ත්‍රිකුණාමලය, මඩකලපුව, කාත්තන්කුඩි, අම්පාර, පොතුවිල්, සියඹලාණ්ඩුව, පානම, වැල්ලවාය, මොණරාගල, බුත්තල, බණ්ඩාරවෙල, ගාල්ල, මාතර, වලස්මුල්ල, රත්නපුර, මහනුවර, මාතලේ, කුරුණෑගල, බදුල්ල සහ තලවකැලේ යන ප්‍රදේශයන්ට අයත් වූහ. මෙම මසක කාලය තුළ ඉතා වේගවත් හා තීව්‍ර ලෙස ගොඩනැංවුණු සමාජ දේශපාලන සංසිද්ධිදාමය පහතින් සංක්ෂිප්තකොට දක්වන්නේ අප සම්මුඛ සාකච්ඡාවට ලක් කළ අයවලුන් ස්වකීය අදහස් ගොනු කළේ එකී සීඝ්‍ර වෙනස්කම් ඔස්සේ ගලා ගිය සිදුවීම් ප්‍රවාහයේ බලපෑමට ගොදුරු වූවන් ලෙසින් වන බැවිණි.

## සිදුවීම් පෙළගැස්ම

■ **ඔක්තෝබර් 26** - එක්සත් ජනතා නිදහස් සන්ධානය ජාතික ආණ්ඩුවෙන් ඉවත් වීමට තීරණය කරයි. ජනාධිපතිවරයා විසින් රනිල් වික්‍රමසිංහව අග්‍රාමාත්‍ය ධූරයෙන් ඉවත් කරමින්[5], කැබිනට් මණ්ඩලය විසුරුවමින්[6] සහ මහින්ද රාජපක්ෂ අගමැති ධූරයට පත් කරමින්[7] ගැසට් නිවේදන 3 ක් නිකුත් කරයි.

■ **ඔක්තෝබර් 27** - රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ එක්සත් ජාතික පෙරමුණ ජනාධිපතිවරයාගේ තීරණය පිළිනොගෙන අරලියගහ මන්දිරයේ රැඳී සිටියි.

■ **ඔක්තෝබර් 27** - ජනාධිපතිවරයා විසින් නොවැම්බර් 16 වන දින දක්වා පාර්ලිමේන්තුව වාර අවසාන කරයි.

■ **ඔක්තෝබර් 28** - පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පක්ෂ මාරු කිරීම ආරම්භ කරති.

---

5. 2094/43 දරන ගැසට් නිවේදනය
6. 2094/43 A දරන ගැසට් නිවේදනය
7. 2094/44 දරන ගැසට් නිවේදනය

■ **ඔක්තෝබර් 29** - මෙදින සිට නොවැම්බර් 09 දින දක්වා අවස්ථා කිහිපයකදී නව කැබිනට් මණ්ඩලය දිවුරුම් දෙයි.

■ **ඔක්තෝබර් 30** - පාර්ලිමේන්තුව කැඳවන ලෙසට ඉල්ලා මන්ත්‍රීවරුන් 128 දෙනෙකු අත්සන් කළ ලිපියක් කතානායකවරයා වෙත භාරදෙයි.

■ **ඔක්තෝබර් 30** - ජනාධිපතිවරයාගේ තීරණයට විරෝධය සහ පක්ෂපාතීත්වය පල කරන පිරිස් උද්ඝෝෂණ හා රැළි සංවිධානය කිරීම අරඹති.

■ **නොවැම්බර් 02** - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මුදලට මිලදී ගනු ලබන බවට වන චෝදනා මහින්ද රාජපක්ෂ රජය වෙත එල්ල වෙයි.

■ **නොවැම්බර් 02** - මහින්ද රාජපක්ෂට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් කතානායකවරයා වෙත භාරදෙයි.

■ **නොවැම්බර් 04** - පාර්ලිමේන්තුව නැවත කැඳවන දිනය නොවැම්බර් 14 බව දක්වමින් ජනාධිපතිවරයා විසින් ගැසට් නිවේදනයක් නිකුත් කරයි.[8]

■ **නොවැම්බර් 09** - ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් ජනවාරි 05 දින මහමැතිවරණයක් පැවැත්වීමට නියෝග කරමින් අති විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරයි.[9]

■ **නොවැම්බර් 10** - ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ගත් තීරණය ව්‍යවස්ථා විරෝධී බව පවසමින් එකී ගැසට් පත්‍රය අහෝසි කරන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් 13 ක් ඉදිරිපත් කෙරෙයි.

■ **නොවැම්බර් 13** - ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී පෙත්සම් විභාගයට ගැනීමට තීරණය කරන අතර ජනාධිපතිවරයාගේ ගැසට් නිවේදනය අත්හිටුවමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරයි.

---

8. 2095/50 දරන ගැසට් නිවේදනය
9. 2096/70 දරන ගැසට් නිවේදනය

■ **නොවැම්බර් 14** - පාර්ලිමේන්තුව රැස්වෙයි. විශාල කළබලකාරීත්වයක් මධ්‍යයේ නව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂට එරෙහි විශ්වාසභංගයක් වැඩි ඡන්දයෙන් සම්මත වෙයි.

■ **නොවැම්බර් 15** - මන්ත්‍රීවරු 122 කගේ ඡන්දයකින් මහින්ද රාජපක්ෂට එරෙහි විශ්වාසභංගය සම්මත වූ බවත්, ඒ අනුව ආඥාපනත ක්‍රම ව්‍යවස්ථාවට අනුව ඉදිරි පියවර ගන්නා ලෙසත් දන්වමින් කථානායකවරයා විසින් ජනාධිපතිවරයා වෙත ලිපියක් යවයි.

■ **නොවැම්බර් 15** - පාර්ලිමේන්තුවේ විශ්වාසභංගය සම්මත වූ ආකාරය පිළිගත නොහැකි බවත්, විධිමත් ආකාරයට විශ්වාසභංගයක් ඉදිරිපත් කොට සම්මත කර ගන්නා ලෙසත් ජනාධිපතිවරයා විසින් කතානායකවරයාට දැනුම් දෙයි.

■ **නොවැම්බර් 16** - මහින්ද රාජපක්ෂට සහාය දක්වන මන්ත්‍රීවරුන් කතානායකවරයාට සිය ස්වකීය කාර්යයන් කරගෙන යාමට ඉඩ නොදෙන අතර විශාල බාධා කිරීම් මධ්‍යයේ දෙවන වරටත් මහින්ද රාජපක්ෂට එහෙිව ඉදිරිපත් වූ විශ්වාසභංගය දෙවන වරටත් සම්මත වූ බව කතානායකවරයා ප්‍රකාශයට පත් කරයි. එය සම්මත වූ ක්‍රමවේදයට විරුද්ධ වෙමින් ජනාධිපතිවරයා එම තීරණය ද පිළි නොගනියි.

■ **නොවැම්බර් 24** - මහින්ද රාජපක්ෂ හා ඔහුගේ කැබිනට් මණ්ඩලයේ පත් කිරීම් නීත්‍යානුකූල නොවන බැවින් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය තහනම් කරමින් ක්වෝ වොරෙන්ටෝ ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 122 ක් විසින් අභියාචනාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරයි.

■ **නොවැම්බර් 29** - නව කැබිනට් මණ්ඩලය හා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ රාජ්‍ය මුදල් පරිහරණය තහනම් කරමින් පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් සම්මත කරයි.

■ **දෙසැම්බර් 03** - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනාගේම කැමැත්ත හිමිකර ගත්ත ද තමන් රනිල් වික්‍රමසිංහට නැවත අග්‍රාමාත්‍ය ධූරය ලබා නොදෙන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කරයි.

■ **දෙසැම්බර් 07** - මහින්ද රාජපක්ෂ හා ඔහුගේ කැබිනට් මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය තාවකාලිකව තහනම් කරමින් අභියාචනාධිකරණය විසින් ක්වෝ වොරෙන්ටෝ ආඥාවක් නිකුත් කරයි (එකී ආඥාවට එරෙහිව මහින්ද රාජපක්ෂ විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරයි).

■ **දෙසැම්බර් 08** - මහින්ද රාජපක්ෂට පාර්ලිමේන්තුවේ බහුතරය පෙන්වීමට නොහැකි වූයේ මන්ත්‍රීවරුන් මිලදී ගැනීමේදී ඔවුන්ගේ මිල දරාගත නොහැකි තරමට ඉහළ ගිය නිසා බව ජනාධිපතිවරයා කියා සිටියි.


■ **දෙසැම්බර් 12** - රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරන ලෙස ඉල්ලා සිටිමින් යෝජනාවක් පාර්ලිමේන්තුවේදී බහුතර ඡන්දයෙන් සම්මත වේ.

■ **දෙසැම්බර් 13** - පාර්ලිමේන්තුව විසුරවමින් ජනාධිපතිවරයා නිකුත් කළ ගැසට් නිවේදනය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරයි.

■ **දෙසැම්බර් 15** - මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස්වෙයි.

## ඔක්තෝබර් 26 සිදුවීම ගැන...

අපගේ සෑම සංවාදයක්ම ආරම්භ වූයේ මෙම දීර්ඝ සිදුවීම් දාමයේ මූලික සංසිද්ධිය වන ඔක්තෝබර් 26 වන දින සිදුවීම පිළිබඳව වන මූලික කතාබහකිනි. අප සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළ 143 දෙනාගෙන් 50 දෙනෙකු (35%) එකී සිදුවීම සම්බන්ධයෙන් තමාගේ එකඟතාවය පළ කර සිටි අතර 52 දෙනෙකු (36%) ඒ සම්බන්ධයෙන් සිය අප්‍රසාදය පළ කර සිටියහ. තවත් 25 දෙනෙක් (18%) සමස්ත සිදුවීම් දාමයම තමන්ව විපිළිසර කළ බවත්, 26 දින සිට සිදුවූ සිදුවීම් හොඳ/නරක ලෙස නිශ්චය කිරීමට තමුන් අපොහොසත් වූ බවත්




2018 ඔක්තෝබර් 26 සිදුවීම පිළිබඳ ජනතා අදහස්
(රූපසටහන 01)

කියා සිටියහ. 16 දෙනෙකු ඒ සම්බන්ධයෙන් කිසිදු නිශ්චිත අදහසක් දැක්වීමට කැමැත්තක් පල කළේ නැත.

26 දින සිදුවීම සම්බන්ධයෙන් ප්‍රසාදය සහ අප්‍රසාදය පල කළ පිරිස් සංඛ්‍යාත්මකව ආසන්න සංඛ්‍යා ලෙස නිරූපණය වුවද එහි පැවති සුවිශේෂීතාවයක් වූයේ අප්‍රසාදය පල කළ 52 න් 7 දෙනෙකු (ගාල්ල, පානම සහ පොලොන්නරුව) හැර ඉතිරි සියල්ලන්ම මඩකළපුව, යාපනය, පුත්තලම, කාත්තන්කුඩි, වැල්ලවාය සහ තලවකැලේ යන ප්‍රදේශයන්ට අයත් දෙමළ හා මුස්ලිම් ජාතිකයන් වීමයි. පොදුවේ ගත් කළ 26 සිදුවීම සම්බන්ධයෙන් එකඟතාවය පල නොකිරීමට හේතු ලෙස ප්‍රකාශ වූ අදහස් වල ගැබ්වූ හැඟීම පානම දී අපට හමුවූ එක් සිංහල කාන්තාවකගේ ප්‍රකාශයකින් ගෙනහැර දක්වන්නේ නම් මෙසේය;

> "26 සිදුවීම ගැන ශ්‍රී ලංකා එකේ (ශ්‍රී.ල.නි.ප.) අය පවා පුදුම වුනා. මගේ මාමා එහෙම කෙනෙක්. එයා කිව්වෙත් එක රැයින් මේක කරපු එක අසාධාරණයි කියලා. නමුත් පාක්ෂිකයෝ

විදියට ඒගොල්ලො ඒක එළිපිට කියන්නේ නැහැ. 26 වෙනිදා තමන්ගේ ආණ්ඩුවක් ලැබුණු සතුටට ඒ අය රතිඤ්ඤා දැම්මා තමයි. නඩු තීන්දුවෙන්[10] පස්සෙ යූ.එන්.පී. (එ.ජා.ප.) අය රතිඤ්ඤා දැම්මා. ශ්‍රී ලංකා එකේ අය ඒක ප්‍රශ්නයක් කර ගත්තේ නෑ. මොකද ඒගොල්ලො දන්නවා ඒ අය භුක්ති වින්දෙ භුක්ති නොවිඳිය යුතු සතුටක් කියලා."



නව අග්‍රාමාත්‍යවරයා ලෙස මහින්ද රාජපක්ෂ 2018 ඔක්තෝබර් 26 දින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ඉදිරියේ දිවුරුම් දුන් අවස්ථාව

උපුටා ගැනීම : http://nepallive.com/story/35096

වැල්ලවාය ප්‍රදේශයේ කාන්තාවක් කියා සිටියේ 26 දින රතිඤ්ඤා හඬ ඇසුණු විට වන අලින් ගම් වැදී යැයි තමන් බියට පත් වූ බවයි.[11] ඇය එම සිදුවීම හැඳින්වූයේ 'කවුරුත් දන්නැතුව ආණ්ඩු වෙනසක් කරලා'[12] යනුවෙනි. අප හා අදහස් දැක්වූ බහුතරයකට 26 දින සිදුවීමේ පවත්නා උභතෝකෝටිකය වනුයේ එය කිසිවෙකුට නොදන්වා

10. ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවමින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය තාවකාලිකව අත්හිටුවමින් 2018/11/13 දින නිකුත් කළ අතුරු තහනම් නියෝගය.

11. 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, වැල්ලවාය ප්‍රදේශයේ කාන්තාවක්.

12. එම

පාර්ලිමේන්තුව හෝ ජනතාව සමග කිසිදු සංවාදයකින් තොරව සිදු කරන ලද විපර්යාසයක් වීමයි. කෙටියෙන් පවසන්නේ නම් ඔවුන් කියා සිටියේ 'කරපු විදිය හොඳ නෑ'[13] යන්නයි. ඒ බොහෝ දෙනෙක් මෙම සිදුවීම දුටුවේ දේශපාලන කුමන්ත්‍රණයක් ලෙසය. ඔවුන්ට අනුව මෙය 'නායකයින් දෙදෙනෙකුගේ හෝ තිදෙනෙකුගේ ප්‍රශ්නයක් රටේ ප්‍රශ්නයක් බවට පත්කරලීමකි.'[14] සමහරෙකු මෙය හඳුන්වා දුන්නේ 'ෆැසිස්ට් තීරණයක්'[15], 'ව්‍යවස්ථා විරෝධී තීරණයක්'[15], 'නීතියේ පාලනයට විරුද්ධව ගත් තීරණයක්'[17], 'ජනතාවගේ ඡන්ද අයිතිය අහෝසි කිරීමක්'[18], 'බල තණ්හාව නිසා ගත් තීරණයක්'[19], 'ජනතාවගෙන් විමසීමක් නොකොට ලොකු ලොකු අය එකතු වෙලා දේවල් වෙනස් කිරීමක්'[20] යනාදී වශයෙනි. 26 සිදුවීම අනුමත නොකළ පිරිස් එහි ප්‍රතිඵලය 'රට අස්ථාවර වීමක්'[21] , 'ජාත්‍යන්තරය ඉදිරියේ රටම විහිළුවක් බවට පත් වීමක්'[22] යනාදී ලෙස විස්තර කළහ.

> **"අප හා අදහස් දක්වූ බහුතරයකට 26 දින සිදුවීමේ පවත්නා උභතෝකෝටිකය වනුයේ එය කිසිවෙකුට නොදන්වා පාර්ලිමේන්තුව හෝ ජනතාව සමග කිසිදු සංවාදයකින් තොරව සිදු කරන ලද විපර්යාසයක් වීමයි."**

---

13. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ කම්කරුවෙක්.

14. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙක්, 2018/11/25 සම්මුඛ සාකච්ඡාව, මඩකළපුව ප්‍රදේශයේ තැනැත්තෙක්.

15. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනයේ සුළු ව්‍යාපාරිකයෙක්.

16. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනයේ ගොවියෙක්.

17. 2018/11/08 සම්මුඛ සාකච්ඡාව, මඩකළපුවේ මුස්ලිම් කාන්තාවක්.

18. 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, මඩකළපුවේ තැනැත්තෙක්.

19. 2018/11/11 සම්මුඛ සාකච්ඡාව, මාතර ප්‍රදේශයේ තැනැත්තෙක්.

20. 2018/11/06 සම්මුඛ සාකච්ඡාව, පොළොන්නරුව ප්‍රදේශයේ ත්‍රීරෝද රථ රියදුරෙක්.

21. 2018/11/11 සම්මුඛ සාකච්ඡාව, පුත්තලම ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙක්.

22. 2018/11/24 සම්මුඛ සාකච්ඡාව, මඩකළපුව ප්‍රදේශයේ තැනැත්තෙක්.

26 වන දින සිදුවීම අනුමත කළ අතිබහුතරය සිංහල ජාතිකයින් වූ අතර ඔවුන්ගේ අදහස් වල පොදු පදනම වූයේ මෙම සිදුවීම රට ගමන් කරමින් තිබූ දිශානතිය (ඔවුන්ට අනුව අහිතකර) වෙනස් කිරීමට මුල් වනු ඇති බවයි. 26 වන දින පුවත කණවැකුණු සැනින් ඔවුන් උද්දාමයට පත් වූයේ එබැවිණි.

> "සතුට වැඩිකමට රතිඤ්ඤා හොයාගෙන දිව්වා. අපි දන්සැලකුත් දුන්නා."[23]

## රනිල් වික්‍රමසිංහ සහ මහින්ද රාජපක්ෂ

මූලික අවස්ථාවේ ආනන්දයෙන් ඔබ්බට ගොස් 26 දින වෙනස තාර්කික ලෙස යුක්ති සහගත කිරීම ද අප ලද ප්‍රතිචාර තුළ හඳුනාගත හැකිවිය. පානදුර ප්‍රදේශයේ එක්තරා රජයේ සේවකයෙකු පැහැදිලි කළ පරිදි 2018 පෙබරවාරි පළාත් පාලන මැතිවරණයේදී ජනතාව විසින් දක්වන ලද ප්‍රතිචාරය රනිල් වික්‍රමසිංහ රජයේ ගමන් මඟ පැහැදිලි ලෙසම ප්‍රතික්ෂේප කිරීමකි.[24] නමුත් ජාතික තලයේ ආණ්ඩුකරණය තුළ එකී ප්‍රතිචාරය නිරූපණය නොවීය. 26 දින සිදුවූයේ එකී වරද නිවැරදි කිරීමයි.[25] තවත් තැනකදී කියැවුනේ නුදුරේදීම අත්සන් කිරීමට නියමිතව තිබූ රටට අහිතකර ගිවිසුම් ගනණාවක් නැවැත්වීමේ අරමුණින් මෙය සිදුකරන්නට ඇතැයි තමන් කල්පනා කරන බවයි.[26]

---


23. 2018/11/01 සම්මුඛ සාකච්ඡාව, කුරුණෑගල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ රියදුරෙක්.

24. 2018 පෙබරවාරි මස 10 දින පළාත් පාලන ආයතන 337 ක් සඳහා පැවති මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට දිනාගත හැකිවූයේ පළාත් පාලන ආයතන 34 ක් පමණි. මහින්ද රාජපක්ෂ විසින් නායකත්වය දෙන ලද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පළාත් පාලන ආයතන 231 ක් ජයග්‍රහණය කරන ලදී.

25. 2018/11/02 සම්මුඛ සාකච්ඡාව, පානදුර ප්‍රදේශයේ රජයේ සේවකයෙක්.

26. 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, වැල්ලවාය ප්‍රදේශයේ තැනැත්තෙක්.

26 දින සිදුවීමට පක්ෂව අදහස් දක්වන ලද අති බහුතරයක් පමණක් නොව එයට විරුද්ධ වූ සැළකිය යුතු පිරිසක් පවා රනිල් වික්‍රමසිංහට අග්‍රාමාත්‍ය ධූරය අහිමි වීම අනුමත කර සිටියහ. ඔහු බලයෙන් පහ කිරීමට 81 දෙනෙකු (57%) තම ප්‍රසාදය පල කර සිටි අතර එයට අකමැත්තක් දක්වූයේ 29 දෙනෙකු (20%) පමණි. තවත් 33 දෙනෙකු (23%) ඒ පිළිබඳව නිශ්චිත අදහසක් පල කර සිටීමෙන් වැළකී සිටියහ.




2018 ඔක්තෝබර් 26 දින රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍ය ධූරයෙන් ඉවත් කිරීම පිළිබඳ ජනතා අදහස්

(රූපසටහන 02)

ඔක්තෝබර් 26 වන දින සිදුවීම සම්බන්ධයෙන් අප්‍රසාදය පල කර සිටි අතිබහුතරයක් දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ට අයත් වූවන් වන නමුත් රනිල් වික්‍රමසිංහට බලය අහිමි වීම සම්බන්ධයෙන් එවැනි විභේදනයක් හඳුනාගත හැකි නොවිණි. එනම් සියලු ජනකොටස් වලට අයත් බහුතරයක් ඔහුට බලය අහිමි වීම ධනාත්මක ලෙස අර්ථනිරූපණය කරන ලදී. සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින එක්සත් ජාතික පක්ෂයට සිංහල නොවන ජන කොටස් අතර වැඩි ප්‍රසාදයක් පවතින බවට වන පොදු පිළිගැනීම තවදුරටත් වලංගු වන්නේ ද යන්න අප සම්මුඛ සාකච්ඡාවන්ට බඳුන් කළ පුද්ගලයින් සම්බන්ධයෙන් නම් සත්‍යයක්

බැව් පෙනී ගියේ නැත. නමුත් අප හා අදහස් දැක්වූ සිංහල ප්‍රජාවේ සාමාජිකයින් කල්පනා කළේ එක්සත් ජාතික පක්ෂයට දෙමළ හා මුස්ලිම් ප්‍රජාවගේ වැඩි මනාපයක් හිමිවන බවයි.

> "රනිල් මුස්ලිම්, දෙමළ ඡන්ද බලාගෙන ඉන්න මිනිහෙක්."[27]
>
> "රනිල් අපේ ආගම සංස්කෘතියට පටහැනි ගමනක් ගියේ."[28]

රනිල් වික්‍රමසිංහගේ පාලනය පිළිබඳව මහජන අප්‍රසාදය මූලිකවම කේන්ද්‍රගත වූයේ ඔහුගේ ආර්ථික කළමණාකරණය සම්බන්ඳයෙනි. එහිදී කිසිදු ජනවාර්ගික හා භූගෝලීය සුවිශේෂීතාවයක් හඳුනාගත හැකි නොවිණි.

> "රනිල් රැකියා දුන්නේ නැහැ. එයා ධනවත් අය උසස් කරල සලකනවා. සාමාන්‍ය මිනිස්සුනට ඕන දේශපාලනයේ හඬ රනිල් ගාව නැහැ."[29]
>
> "රටේ දේශපාලන, ආර්ථික ප්‍රශ්න වලදී රනිල්ගේ මැදිහත්වීමේ හා ක්‍රියාත්මක වීමේ දුර්වලතා තිබුණා."[30]
>
> "රටේ සම්පත් වික්කා. පාසල් නිල ඇඳුම් වෙනුවට වව්චර් දුන්නා. අපේ ගම්වල සමහර මිනිස්සු වව්චරය කියන්නේ මොකක්ද කියලවත් දන්නෑ."[31]
>
> "රනිල් අපි වගේ පහල පාන්තික පොඩි මිනිස්සු ගැන හිතුවේ නැහැ."[32]

---

27. 2018/11/25 සම්මුඛ සාකච්ඡාව, මොණරාගල ප්‍රදේශයේ තැනැත්තියක්.

28. 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, වැල්ලවාය ප්‍රදේශයේ තැනැත්තියක්.

29. 2018/11/23 සම්මුඛ සාකච්ඡාව, පානම ප්‍රදේශයේ තැනැත්තියක්.

30. 2018/11/24 සම්මුඛ සාකච්ඡාව, මඩකළපුව ප්‍රදේශයේ තැනැත්තෙක්.

31. 2018/11/19 සම්මුඛ සාකච්ඡාව, වලස්මුල්ල ප්‍රදේශයේ තැනැත්තෙක්.

32. 2018/11/01 සම්මුඛ සාකච්ඡාව, කුරුණෑගල ප්‍රදේශයේ ලොතරැයි පත් අලෙවි කරන්නියක්.

"සංවර්ධනයෙන් මිනිසාට යහපතක් සිදුවෙන්න ඕන. ඒත් මේ සංවර්ධනයේ එහෙම එකක් තිබුන් නෑ."[33]



අග්‍රාමාත්‍ය ධූරයෙන් පහකළ රනිල් වික්‍රමසිංහ ඇතුළු එක්සත් ජාතික පක්ෂය එම තීරණය පිළිනොගෙන අරලියගහ මන්දිරයේ රැඳී සිටිමින් ජනතාව හමුවට පැමිණි අයුරු.

උපුටා ගැනීම : https://timesofoman.com/article/66782

රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා මහබැංකු බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් වගකිව යුතු බව දිවයිනේ සියලු ප්‍රදේශයන්හි අපට හමුවූ ජනතාවගෙන් අති බහුතරයක් විශ්වාස කළ අතර ඔහුගේ ආර්ථික කළමණාකරණයේ දුර්වලතාවය සම්බන්ධයෙන් බොහෝ විට ඉදිරිපත් වූ නිදර්ශනය වූයේ එයයි[34]. අනාගත කවර හෝ රජයක් ප්‍රමුඛතාවය දියයුතු කරුණ පිළිබඳව විමසා සිටීමේදී අප හා අදහස් දැක්වූ අයගෙන් 69.2% ක්ම කියා සිටියේ ආර්ථිකය කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවයි. රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා බලයෙන් පහ වීම අනුමත කළ අතිබහුතරයේ අදහස වූයේද ආර්ථික කළමණාකරණයේදී ඔහු සාර්ථක වී නොමැති බවයි.

33. 2018/11/02 සම්මුඛ සාකච්ඡාව, හම්බන්තොට ප්‍රදේශයේ රජයේ නිලධාරියෙක්.

34. බැඳුම්කරයක් යනු කුමක්දැයි නොදන්නා බව පවා පෙනී ගිය පිරිස් මෙම චෝදනාව ඉදිරිපත් කිරීමෙන් පෙනී ගියේ එම අදහස කෙතරම් බරපතල ලෙස සමාජ සංවාදයට බඳුන්ව තිබිණිද යන්නයි.

ජනවාර්ගික හෝ භූගෝලීය විභේදනයකින් තොරව රනිල් වික්‍රමසිංහගේ ආර්ථික ප්‍රතිපත්ති සහ ආර්ථික කළමණාකරණය සම්බන්ධයෙන් ජනතාව අතෘප්තිය පල කරද්දී මහින්ද රාජපක්‍ෂගේ දේශපාලන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් තම මනාපය පල කළ පිරිසගෙන් අතිබහුතරය සිංහල ජන ප්‍රජාවට අත් වූහ. අප සම්මුඛ සාකච්ඡාවට ලක් කළ 143 දෙනාගෙන් 48 දෙනෙකු ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන්ට අයත් වූ අතර එයින් 37 දෙනෙකු (77.08%) මහින්ද රාජපක්‍ෂ නැවත වතාවක් අග්‍රාමාත්‍ය ධූරයට පත්වීම සම්බන්ධයෙන් විරෝධය පලකළේ ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කළ කාලය තුළ ඔහු ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්තිය සලකමින් නොව දේශපාලන ප්‍රතිපත්ති පදනම් කර ගනිමිනි.

> "දෙමළ ජනතාව වගේම සමස්ත රටේ පුරවැසියන් එක්ව පසුගිය ජනාධිපතිවරණයේදී පරාජයට පත් කළ කෙනෙක්, ඒ වගේම අපරාධ වලට සම්බන්ධ කෙනෙක් අගමැති ලෙස පත් කිරීම වැරදයි."[35]

> "මහින්දට නම් ආයෙත් කවදාවත්ම බලය දෙන්න ඕන නැහැ. එයා දෙමළ ජනතාවට කරපු විනාශය අපට කවදාවත් අමතක වෙන්නේ නෑ."[36]


> "මහින්දට බලය ලැබුණොත් ඒක මුස්ලිම් ජනතාවටත්, පොදුවේ රටටත් අනතුරක්"[37]

---

35. 2018/11/20 සම්මුඛ සාකච්ඡාව, මඩකළපුව ප්‍රදේශයේ වැසියෙක්.
36. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ වැසියෙක්.
37. 2018/11/23 සම්මුඛ සාකච්ඡාව, කාත්තන්කුඩි ප්‍රදේශයේ තැනැත්තෙක්.

යම් යම් අවස්ථාවල දේශපාලන වේදිකා හා සංවාදයන් හි පසුගිය කාලය තුළ ඉදිරිපත් වූ ආර්ථික සංවර්ධනය විසින් අනෙකුත් දේශපාලනික ගැටළු ද්විතීයික හෝ නොවැදගත් බවට පත් කරන්නේය යන තර්කය දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන් සම්බන්ධයෙන් නම් තවමත් නිවැරදි නොවන්නේය යන්න අප ලද ප්‍රතිචාර වලින් අපට එළඹිය හැකි නිගමනයයි.

පොදුවේ ගත් කළ අප සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළ 143 දෙනාගෙන් 63 දෙනෙකු (44%) මහින්ද රාජපක්ෂ නැවත අගමැති ධූරයට පත් වීම ධනාත්මක ලෙස දුටු අතර 62 දෙනෙකු (43%) එයට අප්‍රසාදය පල කරන ලදී. 18 දෙනෙකු (13%) ප්‍රතිචාර දැක්වීමෙන් වැලකී සිටියහ.




2018 ඔක්තෝබර් 26 දින මහින්ද රාජපක්ෂ නව අග්‍රාමාත්‍ය ධූරයට පත්කිරීම පිළිබඳ ජනතා අදහස්

(රූපසටහන 03)

## දේශපාලන සදාචාරය

ඔක්තෝබර් 26 මහින්ද රාජපක්ෂ නැවත අග්‍රාමාත්‍ය ධූරයට පත්වීම සම්බන්ධයෙන් සිංහල ජනතාව බහුතරයක් වෙසෙන ප්‍රදේශවල සිදුකළ සම්මුඛ සාකච්ඡාවල බහුතරයකගේ අදහස වූයේ එය ඉතා සුබදායක එකක් වන බවයි. විශේෂයෙන්ම දේශපාලන පරිවර්තනය වූ මුල් දින 10 ක පමණ කාලය තුළ ඔවුන් එයින් අමන්දානන්දයට පත්ව සිටි බවක් අපට පෙනී ගියේය.

> "හැමෝම කැමති මහින්ද මහත්තයට. ඉතින් තව මොන කතාද. රනිල්ට පරාජය බාර අරගෙන බැහැල යනව ඇරෙන්න වෙන කරන්න දෙයක් නෑ."[38]

> "පාර්ලිමේන්තුවේ මොකක් වුනත් දිනන්න ඕන මහින්ද මහත්තයා. එයා දිනනවා විතරක් නෙමෙයි දිගටම බලයේ ඉන්නවා."[39]

නමුත් දින ගතවත්ම අධිකරණ ක්‍රියාමාර්ග, පාර්ලිමේන්තුවේ සිදුවූ විවිධ හැලහැප්පීම් යනාදී සිදුවීම් දිගහැරෙද්දී ජනතාව මහින්ද රාජපක්ෂගේ බලයට පැමිණීම පිළිබඳව වඩාත් විචාරාත්මකව අදහස් දක්වන ආකාරයක් පෙනී ගියේය.

> "මහින්ද මහත්තයා මේ විදියට අගමැති නොවී ඡන්දයකින් අගමැති වුනා නම් මීට වඩා හොඳයි."[40]

---

38. 2018/11/01 සම්මුඛ සාකච්ඡාව, කුරුණෑගල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ රියදුරෙක්.
39. 2018/11/02 සම්මුඛ සාකච්ඡාව, රත්නපුර ප්‍රදේශයේ පළතුරු වෙළෙන්දෙක්.
40. 2018/11/12 සම්මුඛ සාකච්ඡාව, ගාල්ල ප්‍රදේශයේ තැනැත්තෙක්.

> "මහින්ද මහත්තයා බලයට පත් වෙච්ච එක ගැන මං කැමතියි. හැබැයි මේකෙන් වෙන්නේ ඒකාධිපති පාලනයකට රට ගමන් කිරීමක්. මොකද මහින්ද මහත්තයා පාර්ලිමේන්තු බහුතරය පිළිගත්තේ නැහැනේ."[41]

තවත් සති දෙකක් පමණ ඉකුත් වෙද්දී සිදුවීම් සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ පාක්ෂිකයින් පවා අදහස් දැක්වූයේ මෙසේය.

> "මහින්ද මහත්තයා කොහොමත් බෙදාගත්ත බත් එක කනවමයි. පරාද වෙලා පස්සෙන් දූවල දූවල මේක ගත්තෙ දෙන්න නෙමෙයි. එයා කොහොමත් චණ්ඩියා."[42]


මෙලෙස අප වෙත ඉදිරිපත් වූ අදහස් වල වෙනස් වීම විසින් නිරූපණය කරන්නේ සිංහල ජනතාවගේ බහුතරයක් 26 වෙනස සහ මහින්ද රාජපක්ෂ අගමැති ධූරයට පත්වීමට පක්ෂපාතී වන නමුත් එකී ක්‍රියාවේ දේශපාලන සදාචාරය ඔවුන්ට වැදගත් වන බවයි.

දේශපාලන සදාචාරය පිළිබඳ අදහස් වඩාත් තීව්‍ර ලෙස හඳුනාගත හැකි වූයේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පලවූ අදහස් තුළිනි. පොදුවේ ගත් කළ අප සම්මුඛ සාකච්ඡාවට ලක්කළ 143 දෙනාගෙන් 68 දෙනෙකු (48%) ඔක්තෝබර් 26 වන දින ඔහු විසින් සිදුකළ මහින්ද රාජපක්ෂගේ පත්කිරීම සහ අනතුරුව ඔහු ගත් ක්‍රියාමාර්ග පිළිබඳව නොඑකඟතාව පල කර සිටි අතර 51 දෙනෙකු (36%) ඔහුගේ ක්‍රියාකලාපය අනුමත කළහ. තවත් 5 දෙනෙකු ජනාධිපතිවරයාගේ ක්‍රියාකලාපය අනුමත කළ නමුත් එහි අවංකභාවය පිළිබඳ සැකසංකා මතුවන බව කියා සිටියහ. 19 දෙනෙකු (13%) පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළහ.

---

41. 2018/11/11 සම්මුඛ සාකච්ඡාව, මාතර ප්‍රදේශයේ තැනැත්තියක්.

42. 2018/11/23 සම්මුඛ සාකච්ඡාව, බුත්තල ප්‍රදේශයේ පෞද්ගලික ආරක්ෂක නිලධාරියෙක්.




2018 ඔක්තෝබර් 26 දින සහ ඉන් අනතුරුව
ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ ක්‍රියාකලාපය පිළිබඳ ජනතා අදහස්

(රූපසටහන 04)

සෑම ප්‍රදේශයකම පාහේ ජනාධිපතිවරයාගේ තීරණය කෙරෙහි අප්‍රසාදය පල කළ පිරිස් එකී අප්‍රසාදයට පදනම ලෙස දක්වූයේ 2015 දී ඔහු ජනතාව වෙත ඉදිරිපත් කරන ලද අදහස් සහ වර්තමාන ක්‍රියාකලාපය අතර පවතින පරතරය යි. එය ඔහු ජනතාව සමඟ ඇති කරගත් සම්මුතිය බිඳ දැමීමක් බවත්, එවැන්නක් සිදුකරන්නේ නම් එකී සම්මුතියේ අනෙක් පාර්ශවකරුවා වන ජනතාව වෙත ඔහු විසින් කරුණු දක්විය යුතුව තිබූ බවත් බොහෝ දෙනෙකුගේ අදහස විය. එනයින් ඔවුන්ට අනුව මෙය ආචාර ධර්ම උල්ලංඝණය කිරීමකි. අප හා අදහස් දක්වූ පානම ප්‍රදේශයේ කාන්තාවක් කියා සිටියේ ජනතාව සමඟ වූ ඔහුගේ සම්මුතිය බිඳ දමා ඝාතණ කුමන්ත්‍රණ, බටහිර ගැතිභාවය, රට පාවාදීම වැනි චෝදනාවන් රනිල් වික්‍රමසිංහට එරෙහිව නැගීම පිළිගත නොහැකි බවයි. ඇයට අනුව ඔහු විසින් එකී චෝදනාවන් ජනතාව වෙත කියා පෑ යුතුව තිබුණේ 26 දින තීරණය ගැනීමට පෙර මිස එයින් පසුව නොවේ. මක්නිසාද ජනාධිපතිවරයාගේ සැබෑ සම්මුතිය පැවතියේ රනිල් වික්‍රමසිංහ

සමඟ නොව ජනතාව සමඟ වන බැවිණි.[43] තවත් බොහෝ දෙනෙකු ජනාධිපතිවරයා වෙත නැගූ චෝදනාව වූයේ 'විධායක බලතල අඩු කරමින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට පොරොන්දු වී බලයට පත්වූ අයෙකු'[44] 'බල ලෝභීත්වය හේතුවෙන් නීතියේ සිදුරු තුළින් රිංගා යමින්'[45] 'අයුතු විදියට බලය පාවිච්චි කරමින් ජනතා විශ්වාසය බිඳ දමමින් ඒකාධිපතියෙකු ලෙස කටයුතු කරන'[46] බවයි.

ජනාධිපතිවරයාගේ ක්‍රියාකලාපයේ විශ්වාසනීයභාවය පිළිබඳව ජනතාව තුළ සැකසංකාවන් ගොඩනැඟී තිබුණේ මේ හේතුවෙන් විය හැකිය. ඔවුන් ඒ සඳහා යොදාගත් යෙදුම් වූයේ 'මේකත් 2015 ආප්ප කාල ගත්ත තීරණය වගේම එකක්'[47], 'එක ගෑණියෙක් ගාව ඉඳන් තව ගෑණියෙක් ගාවට ගියා වගේ වැඩක්'[48] යනාදිය යි.

**26 වන දින ජනාධිපතිවරයාගේ ක්‍රියාමාර්ගය ජනතා අභිලාශයන්ට අවකාශය සලසා දීමක් ලෙස දකිද්දී තවත් පිරිසක් කියා සිටියේ එකී තීරණයේ අඩුම අවධානයක් යොමුව තිබුණේ ජනතා අභිලාශයන් කෙරෙහිය යන්නයි. අපට මඩකළපුව ප්‍රදේශයේදී හමුවූ අයෙකු කියා සිටියේ "ඔක්තෝබර් 26 සිදුවීම ඔහුට 'මුදල්වාන්' චිත්‍රපටය සිහිගන්වන" බවයි.**

ජනාධිපතිවරයාගේ තීරණයට බලපෑ සාධාරණ හේතු ලෙස බොහෝ දෙනෙකු ඝාතණ කුමන්ත්‍රණය, රනිල් වික්‍රමසිංහගේ වැරදි ආර්ථික තීරණ, මහබැංකු බැඳුම්කර

43. 2018/11/23 සම්මුඛ සාකච්ඡාව, පානම ප්‍රදේශයේ තැනැත්තියක්.
44. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙක්.
45. 2018/11/23 සම්මුඛ සාකච්ඡාව, මඩකළපුව ප්‍රදේශයේ තැනැත්තෙක්.
46. 2018/11/27 සම්මුඛ සාකච්ඡාව, බදුල්ල ප්‍රදේශයේ තැනැත්තෙක්.
47. 2018/11/06 සම්මුඛ සාකච්ඡාව, පොළොන්නරුව ප්‍රදේශයේ ත්‍රීරෝද රථ යදුරෙක්.
48. 2018/11/11 සම්මුඛ සාකච්ඡාව, මාතර ප්‍රදේශයේ තැනැත්තියක්.



2018/10/26 දින නව අග්‍රාමාත්‍ය ලෙස පත්කළ මහින්ද රාජපක්ෂ සමග ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනතාව හමුවට පැමිණි අයුරු.
උපුටා ගැනීම : **https://facebook.com**

සිදුවීම, රට කඩන ව්‍යවස්ථාවක් ගෙන ඒම වැනි කරුණු පිළිගත් අය පවා එකී තීරණය ක්‍රියාවට නැංවූ ආකාරය ආචාර ධාර්මික නොවන බව කියා සිටියහ. රනිල් වික්‍රමසිංහ සම්බන්ධයෙන් එවැනි ආචාර ධාර්මික කාරණා පදනම් කරගනිමින් ඔවුන් අදහස් දැක්වීමක් නොකළේ ඔවුන් බහුතරයක් රනිල් වික්‍රමසිංහගේ ක්‍රියාකලාපය ඒ වන විටද ප්‍රතික්ෂේප කරන තත්ත්වයක සිටි බැවිණි. ඔවුන්ට අනුව 2015 දී ඔවුන් සම්මුතිය ඇතිකර ගත්තේ රනිල් වික්‍රමසිංහ සමඟ නොව මෛත්‍රීපාල සිරිසේන සමගය. ජනාධිපතිවරයා බිඳ දැමුවේ එකී සම්මුතියයි.

සම්මුඛ සාකච්ඡා තුළ හඳුනාගත හැකි වූ තවත් එක් සුවිශේෂී ලක්ෂණයක් වූයේ විශේෂයෙන්ම උතුරේ දෙමළ ජනයා මෙම සිදුවීම් මාලාව දෙස බලන ලද සැකමුසු ආකාරයයි. සමහරෙකුට අනුව

'මේ පසුපස ජාත්‍යන්තර බලපෑමක්/කුමන්ත්‍රණයක්'[49] පැවතුණි. යාපනයේදී අප සම්මුඛ සාකච්ඡාවට ලක් කළ සුළු ව්‍යාපාරිකයෙකු 26 දින ජනාධිපතිවරයාගේ ක්‍රියාමාර්ගය දුටුවේ 'ඊට ආසන්න කාලයේ සිදුවූ ද්‍රවිඩ ජාතික සන්ධානයේ බිඳී යාමෙන් බිහිවන නව දේශපාලන තත්ත්වය සම්බන්ධයෙන් දක්වන ලද ප්‍රතිචාරයක්'[50] ලෙසයි.

යම් පිරිසක් 26 වන දින ජනාධිපතිවරයාගේ ක්‍රියාමාර්ගය ජනතා අභිලාශයන්ට අවකාශය සලසා දීමක් ලෙස දකිද්දී තවත් පිරිසක් කියා සිටියේ එකී තීරණයේ අඩුම අවධානයක් යොමුව තිබුණේ ජනතා අභිලාශයන් කෙරෙහි බවයි. අපට මඩකළපුව ප්‍රදේශයේදී හමුවූ අයෙකු කියා සිටියේ "ඔක්තෝබර් 26 සිදුවීම ඔහුට 'මුදල්වාන්'[51] චිත්‍රපටය සිහිගන්වන"[52] බවයි.

> "මෛත්‍රී හිතන්නෙත් තමන් ගැන. කවුරුවත් පොඩි මනුස්සය ගැන හිතන්නේ නැහැ."[53]

> "ජනතාව පීඩනයෙන් හිටියේ. නමුත් ජනාධිපතිගේ තීරණයට පදනම් වුනේ සාතණ කුමන්ත්‍රණය. ඉතින් එයා තීරණ ගත්තේ මිනිස්සු ගැන හිතල කියල කියන්න බෑ."[54]

---

49. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ තැනැත්තෙක්, 2018/11/17 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ තැනැත්තෙක්, 2018/11/07 සම්මුඛ සාකච්ඡාව, මුලතිවු ප්‍රදේශයේ තැනැත්තෙක්.

50. 2018/11/17 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ සුළු ව්‍යාපාරිකයෙක්.

51. 'මුදල්වාන්' යනු 1999 වසරේදී ඉන්දියාවේ තිරගත වූ එස්. ශංකර් විසින් අධ්‍යක්ෂණය කරන ලද දෙමළ චිත්‍රපටයකි. එම චිත්‍රපටයේ දිගහැරෙන්නේ මාධ්‍යවේදියෙකුට එක් දිනකට තමිල්නාඩුවේ මහ ඇමති ධූරය හිමිවීමත්, එතැන් සිට ඔහු මුහුණ දෙන සිදුවීම් සමුදායක්ය.

52. 2018/11/08 සම්මුඛ සාකච්ඡාව, මඩකළපුව ප්‍රදේශයේ තැනැත්තෙක්.

53. 2018/11/21 සම්මුඛ සාකච්ඡාව, බණ්ඩාරවෙල ප්‍රදේශයේ තැනැත්තෙක්.

54. 2018/11/01 සම්මුඛ සාකච්ඡාව, මහනුවර ප්‍රදේශයේ වෙළඳසැල් සේවකයෙක්.

## නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය - පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය - ජනතා පරමාධිපත්‍යය පිළිබඳ ජනතා අදහස්

අපගේ සම්මුඛ සාකච්ඡාවන් තුළ වඩාත් තාර්කික හා විචක්ෂණශීලී අදහස් ඉදිරිපත් වූයේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය, පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය සහ ජනතා පරමාධිපත්‍යය සම්බන්ධයෙනි. මූලිකව දැකගත හැකිවූ නිරීක්ෂණයක් වූයේ ඔක්තෝබර් 26 දින සිදුවීමෙන් පසු මුල් සතියක පමණ කාලය තුළ ජනතාවගේ අදහස් වඩාත් කේන්ද්‍රගතව පැවතියේ දේශපාලන බල හුවමාරුව කෙරෙහි තමන් දක්වන කැමැත්ත හෝ අකමැත්ත සහ නව තත්ත්වය විසින් බිහිකිරීමට නියමිත අනාගත සමාජ, දේශපාලන, ආර්ථික තත්ත්වයන් පිළිබඳව වන ශුභදායි හෝ අශුභදායි අපේක්ෂාවන් සම්බන්ධයෙන් වන බවයි. 26 දින සිදුවීමන් පසු එළඹි මුල් දින 10 තුළ පොදුවේ ගත්කළ ජනතාව අපේක්ෂා කළේ සාමාන්‍ය ලෙස නව ආණ්ඩුව රටේ පාලනය ගෙනයනු ඇති බවයි. එහිදී එදෙස සුභවාදීව බැලූ සැලකිය යුතු පිරිසක් නව රජයට පාර්ලිමේන්තුවේ බහුතරය දිනාගැනීමේ අවශ්‍යතාවය හෝ ක්‍රියාවලියේ නෛතික වලංගුතාවය වැනි කරුණු බරපතල ලෙස සලකන බවක් පෙනෙන්නට නොතිබුණි.

> "පාර්ලිමේන්නතුව කැඳෙව්වත් එකයි, නැතත් එකයි. මහින්ද මහත්තයටනේ බහුතරය තියෙන්නේ. අනික පාර්ලිමේන්තුව වෙන දෙයක් කිව්වොත් ජනාධිපතිතුමා ඒකත් බලා ගනියි."[55]

> "පාර්ලිමේන්තුවට කරන්න පුළුවන් බම්බුවක් නෑ. ඔක්කොම තීරණය කරල ඉවරයි. ඔය මොන තීරණය ගත්තත් මේ ආණ්ඩුව තමයි ආණ්ඩුව."[56]

---

55. 2018/11/05 සම්මුඛ සාකච්ඡාව, අනුරාධපුරය ප්‍රදේශයේ තානායම් හිමියෙක්.

56. 2018/11/04 සම්මුඛ සාකච්ඡාව, පොලොන්නරුව ප්‍රදේශයේ බස් කොන්දොස්තරවරයෙක්.

"පාර්ලිමේන්තුවෙන් හරි වෙන විදියකට හරි හොඳ දෙයක්නෙ වුනේ. එච්චරයි."[57]

"පාර්ලිමේන්තුවේ තීරණය කවුරු බාරගත්තත් එකයි, නැතත් එකයි. අපි අලුත් ආණ්ඩුවත් එක්ක."[58]



කතානායකවරයාගේ කටයුතු වලට අවහිර කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එතුළ හැසිරෙන අයුරු.

උපුටා ගැනීම : **https://www.dw.com/en/**

නොවැම්බර් 01 දින කුරුණෑගල ප්‍රදේශයේදී අප සම්මුඛ සාකච්ඡාවට ලක් කළ අයෙක් කියා සිටියේ 'බහුතරයක් නැතුව කොච්චර ආණ්ඩු කරල තියෙනවද. බහුතරය ඕන මුදල් පනත් වගේම අනිත් පනත් සම්මත කරන්න විතරයිනේ. නැත්තං බහුතරයෙන් වැඩක් නෑ'[59] යනුවෙනි.

57. 2018/11/03 සම්මුඛ සාකච්ඡාව, තලවතුගොඩ ප්‍රදේශයේ තරුණයෙක්.

58. 2018/11/02 සම්මුඛ සාකච්ඡාව, රත්නපුර ප්‍රදේශයේ තැනැත්තෙක්.

59. 2018/11/01 සම්මුඛ සාකච්ඡාව, කුරුණෑගල ප්‍රදේශයේ තැනැත්තෙක්.

නමුත් පසුව දිගහැරුණු පාර්ලිමේන්තුවේ ගැටුම්, විශ්වාසභංගයන්, අධිකරණ ක්‍රියාමාර්ග, පක්ෂ මාරු කිරීම් සහ දේශපාලනඥයන්ගේ විවිධාකාර හැසිරීම් දෙස විචාරාත්මකව බැලීමට ඔවුන් වඩ වඩා පෙළඹෙන ආකාරයක් මුල් දින 10 න් පමණ පසුව අපට හඳුනාගත හැකි විය. මසක පමණ කාලයක් ගතවෙද්දී ගොඩනැංවෙමින් පවත්නා දේශපාලන අස්ථාවරත්වය සම්බන්ධයෙන් ජනතාව බැරෑරුම් ලෙස කල්පනා කරන බවක් නිරීක්ෂණය කළ හැකි විය. මෙහිදී පාර්ලිමේන්තුව නොතකමින් හෝ එය මඟහැර යමින් ආණ්ඩු බලය තහවුරු කිරීම පිළිබඳව කල්පනා කරනවා වෙනුවට පාර්ලිමේන්තුව ඔස්සේ ජනතාවගේ අභිලාශයන් නිරූපණය විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු වූ බව පෙනෙන්නට තිබිණි. පොලොන්නරුවේ බුලත් විට විකුණන කාන්තාවක් කියා සිටියේ 'පාර්ලිමේන්තුව අපිව නියෝජනය කරනවා නම් ඒකෙන් අපේ කැමැත්තට වෙනස් තීරණයක් එන්න බැහැනේ'[60] යනුවෙනි. බැලූ බැල්මට සරල යැයි පෙනෙන ඇයගේ ප්‍රකාශය තුළින් කියැවුනේ පාර්ලිමේන්තුව සිය සුජාතභාවය එනම්, මහජනතාව නියෝජනය කිරීම සහතික කිරීමට නම් මහජන මතයට වඩා වෙනස් මතයක් නිරූපණය කිරීමට පාර්ලිමේන්තුවට නොහැකි බවයි. අනෙක් අතට 'මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව ජනතා අභිලාශය වන්නේ නම් ජනතාව නියෝජනය කරන පාර්ලිමේන්තුවෙන් එයට විරුද්ධ තීරණයක් ලැබීමේ හැකියාවක් ද නොමැත.'[61] තත්ත්වය තවත් සංකීර්ණ වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අඛණ්ඩව පක්ෂ මාරු කිරීමට පටන් ගැනීමත් සමඟය. ඒ සම්බන්ධයෙන්

**'කවර තත්ත්වයකදී වුව පාර්ලිමේන්තු බලය ප්‍රතික්ෂේප කිරීම මිලිටරි ආණ්ඩුවකට මග පෑදීමකි.' පත් කිරීමක නීත්‍යානුකූලභාවය තහවුරු කළ හැක්කේ පාර්ලිමේන්තුවට පමණි. ඒ හැර අන් මගක් නොමැත.**

---

54. 2018/11/10 සම්මුඛ සාකච්ඡාව, පොලොන්නරුව ප්‍රදේශයේ සුළු වෙළෙන්දියක්.
55. 2018/11/11 සම්මුඛ සාකච්ඡාව, මාතර ප්‍රදේශයේ කාන්තාවක්.

නම් අප සම්මුඛ සාකච්ඡාවට ලක් කළ තැනැත්තන් 143 දෙනාගෙන් කිහිපදෙනෙකු හැරෙන්නට අන් සියලුදෙනා තුළ පැවතියේ විරෝධයකි. ඔවුන්ගේ මතය වූයේ 'තම නියෝජිතයින් පක්ෂ මාරු කරන්නේ නම් එවිට ඔවුන් තව දුරටත් තමන්ව නියෝජනය නොකරන බවයි. එවැනි තත්ත්වයක් තුළ තව දුරටත් පාර්ලිමේන්තුව ජනතාව නියෝජනය කරන ආයතනයක් ලෙස සැලකිය හැකි නොවේ.'[62] එවැනි තත්ත්වයක 'මහින්ද රාජපක්ෂ හෝ රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවේ පෙන්වන බහුතරය පිළිගත හැක්කක් නොවේ.'[63] තවත් අයෙකු කියා සිටියේ '2015 පාර්ලිමේන්තු මැතිවරණයේදී ජනතාව විසින් ප්‍රතික්ෂේප කරන ලද තැනැත්තන්ද ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත්කොට ඇති බැවින් පාර්ලිමේන්තුව විසින් ජනතාව නිසි පරිදි නියෝජනය කරන්නේ යැයි සැලකිය නොහැකි'[64] බවයි. මේ සියල්ලන් විසින් ප්‍රශ්න කරනු ලැබුවේ පාර්ලිමේන්තුව විසින් ජනතාව නියෝජනය කරනු ලබන්නේ ද, යම්හෙයකින් එසේ නොකරන්නේ නම් එවන් පාර්ලිමේන්තුවකට ජනතා පරමාධිපත්‍යය නියෝජනය කිරීමට ඇති සුජාත අයිතිය කුමක්ද යන ප්‍රශ්නයයි.


> "මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ සල්ලි වලට පැත්ත මාරු කරන අය. ඉතින් බලයේ මූලය කියන්නේ මහජනතාව නම් අපි මේ විකෘති පාර්ලිමේන්තුව පිළිගන්න ඕනද?"[65]

> "පාර්ලිමේන්තුවේ තියෙන්නේ කැලෑ නීතිය කියලා පෙනුනා. ඒ නිසා ඒකේ ගෞරවය සහ බලය තවදුරටත් නෑ."[66]

62. 2018/11/12 සම්මුඛ සාකච්ඡාව, අම්පාර ප්‍රදේශයේ තැනැත්තියක්.
63. 2018/11/21 සම්මුඛ සාකච්ඡාව, බණ්ඩාරවෙළ ප්‍රදේශයේ තැනැත්තෙක්.
64. 2018/11/25 සම්මුඛ සාකච්ඡාව, බුත්තල ප්‍රදේශයේ තැනැත්තෙක්.
65. 2018/11/12 සම්මුඛ සාකච්ඡාව, ගාල්ල ප්‍රදේශයේ තැනැත්තෙක්.
66. 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, මඩකලපුව ප්‍රදේශයේ තැනැත්තෙක්.

"පාර්ලිමේන්තුව උත්තරීතර කියල කියන්නේ ඒගොල්ලෝ. නමුත් ඒගොල්ලන්ම ඒකෙ ගරුත්වය විනාශ කරනවා. පාර්ලිමේන්තුවේ තීරණය ජනමතයට විරුද්ධව ආවත් ඒක දේශපාලන පක්ෂ වලට පිළිගන්න වෙනවා. හැබැයි ජනතාව ඒක පිළිගත යුතු නැහැ. මොකද තමන්ව නියෝජනය නොකරන පාර්ලිමේන්තුවක් ජනතාව පිළිගත යුතු නැහැ."[67]

අප සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළ 143 දෙනාගෙන් 61 දෙනෙකු (42%) මෙම වියවුල විසඳිය හැක්කේ පාර්ලිමේන්තුවට බවත්, තවත් 48 දෙනෙකු (34%) මෙම වියවුල විසඳීමට පාර්ලිමේන්තුවට හැකියාවක් නොමැති බවටත් (34 දෙනෙකු එනම් 24% ක් පිළිතුරු දීමෙන් වැළකී සිටියහ) යන්න වටහාගත යුත්තේ මෙම සන්දර්භය ඇසුරෙනි.




**දේශපාලන හා ව්‍යවස්ථා අර්බුදය තුළ පාර්ලිමේන්තුවේ භූමිකාව පිළිබඳ ජනතා අදහස්**

**(රූපසටහන 05)**

67. 2018/11/21 සම්මුඛ සාකච්ඡාව, මහනුවර ප්‍රදේශයේ තැනැත්තෙක්.

පාර්ලිමේන්තුව විසින්ම මෙම ගැටළුවට පිළිතුරු සොයාගත යුතු යැයි පැවසූ පිරිස අවධාරණය කළේ කවර තත්ත්වයක් තුළ වුවද ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන ආයතනයක් අත්නොහැරිය/මඟනොහැරිය යුතුය යන අදහසිනි. ඔවුන්ට අනුව 'කවර තත්ත්වයකදී වුව පාර්ලිමේන්තු බලය ප්‍රතික්ෂේප කිරීම මිලිටරි ආණ්ඩුවකට මඟ පෑදීමකි.'[68] පත් කිරීමක නීත්‍යානුකූලභාවය තහවුරු කළ හැක්කේ පාර්ලිමේන්තුවට පමණි. ඒ හැර අන් මඟක් නොමැත.

"කවුරු පත් වුනත් ඒක වෙන්න ඕන නීත්‍යානුකූල විදියට."[69]

"පාර්ලිමේන්තුවට පිටින් තීරණ ගන්න එක රට මිලිටරිකරණය කරා ගෙනයාමක්."[70]

"ලෝකයම පාර්ලිමේන්තුව දිහා බලන් ඉන්න නිසා පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉතාම වැදගත්."[71]

තවත් සමහරුන් ප්‍රකාශ කර සිටියේ නීතිය අභියෝගයට ලක් කරන ක්‍රියාවක් සිදුකිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තුවේ ප්‍රතිචාරයේ සුජාතභාවය ප්‍රශ්න කිරීම යුක්ති සහගත නොවන බවයි. ඔවුන්ට අනුව නෛතික වරදකින් නිර්මාණය වූ මෙම උභතෝකෝටිකය විසඳාලිය හැක්කේ නැවත වාරයක් නීතියට අනුගත වීමෙන් පමණකි.

---

68. 2018/11/11 සම්මුඛ සාකච්ඡාව, ගාල්ල ප්‍රදේශයේ තැනැත්තෙක්.

69. 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, රත්නපස්වල ප්‍රදේශයේ සුළු ව්‍යාපාරිකයෙක්.

70. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ තනැත්තෙක්.

71. 2018/11/14 සම්මුඛ සාකච්ඡාව, මාතර ප්‍රදේශයේ තැනැත්තියක්.

> "පාර්ලිමේන්තුවේ කැමැත්ත වෙනුවට දෙන්නෙක්ගේ තීරණයක් තමයි ක්‍රියාත්මක වෙලා තියෙන්නේ. දැන් අගමැති වෙලා තියෙන්නේ පහුගිය අවුරුද්දටම දවස් 10 ක් විතරක්[72] පාර්ලිමේන්තු ආව මනුස්සයෙක්."[73]

වැල්ලවාය ප්‍රදේශයේ කාන්තාවක් අප හා පැවසූයේ 'මොන ප්‍රශ්නෙ වුනත් ඒවා විසඳන්න ඕන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ. මහින්ද මහත්තයා ජනාධිපති කාලේ මොනව කළත් එයා ව්‍යවස්ථාවට පිටින් වැඩ කළේ නෑ. එයා කළේ ඒක ඇතුළේ.'[74] යනුවෙනි. බහුතර පිරිසක් එවැනි මතයක සිටියදී තවත් පිරිසකගේ අදහස වූයේ පිළිගත් ක්‍රමවේදය තුළ විසඳිය නොහැකි තැනකට මෙම තත්ත්වය වර්ධනය වී ඇති බවයි.

**මේ තත්ත්වය තුළ යම් පිරිසක් කියා සිටියේ මෙම උභතෝකෝටිකය විසඳාලිය හැක්කේ මේ සියලු බලයන්ගේ මූලය එනම් පරමාධිපත්‍යය හිමි ජනතාව වෙත නැවත යාමෙන් බවයි.**

අනුරාධපුරයේදී අපට හමුවූ අයෙකු ඇසුවේ 'රටට හෙණ ගැහුවට පස්සෙත් ව්‍යවස්ථාව කන්නද..?'[75] යනුවෙනි. මේ අදහසම වඩාත් සංයමයකින් යුතුව පල කර සිටි රත්නපුර ප්‍රදේශයේ කාන්තාවකට අනුව අවසාන තීරණය නීතියට අනුකූල වන්නා සේම එය ජනමතය නිරූපණය වන්නක් බවට ද පෙනී යා යුතුය. ඇයට අනුව නීතිය සේවය කරන්නේ ජනතාවටයි. යම් හෙයකින් නීතියේ අඩුපාඩු පවතින අවස්ථාවන් හි වඩ වඩාත් ඒ තුළින් ම පිළිතුරක් සොයා ගැනීමට උත්සාහ කිරීමෙන් සිදුවන්නේ නීතියේ අසාර්ථකත්වය/සීමාව අනාවරණය වීමයි. එවන් අවස්ථාවක කළ යුතු වන්නේ නීතියෙන්

---

72. වාර්තාවන්ට අනුව මෙම වසරේ පාර්ලිමේන්තුව රැස්වූ දින 96 න් දින 22 ක් (10 ක් නොවේ) පාර්ලිමේන්තුවේ සැසිවාර සඳහා මහින්ද රාජපක්ෂ සහභාගී වී ඇත. (https..//parliment.lk/en/members_ofparliment/attendence)

73. 2018/11/15 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ කම්කරුවෙක්.

74. 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, වැල්ලවාය ප්‍රදේශයේ තැනැත්තියක්.

75. 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, අනුරාධපුරය ප්‍රදේශයේ තැනැත්තෙක්.

මූලිකවම අපේක්ෂා කළ අරමුණ සලකා බලමින් එකී අරමුණට ගැලපෙන ආකාරයට නීතිය වෙනස් කිරීමයි.[76]

කොළඹදී අපට හමුවූ විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක් කියා සිටියේ 'ඔක්තෝබර් 26 දින සිදුවූයේ නෛතික හා කාර්යපටිපාටිමය වරදක් වන බවත්, එබැවින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කළ ද එය නිවැරදි නොවන'[77] බවත්ය. පානම ප්‍රදේශයේ කාන්තාවක් අප හා අදහස් දක්වමින් කියා සිටියේ මේ වන විට ව්‍යවස්ථානුකූලව විසඳිය නොහැකි තත්ත්වයකට ගැටළුව වර්ධනය වී ඇති බවයි. ඇයට අනුව නැවත නැවතත් ව්‍යවස්ථාව වෙතම යොමු වෙමින් එය විසඳාලීමට උත්සාහ කිරීමෙන් සිදුවන්නේ නැවත නැවතත් එම ව්‍යවස්ථාවට අගෞරව කිරීමකි.[78] ජනතාව විසින් දක්වන ලද මෙබඳු අදහස් මඟින් ඔවුන් පවතින දේශපාලනික තත්ත්වය පිළිබඳව කෙතරම් ගැඹුරින් කල්පනා කරන්නේ ද යන්න සහ ඒ සඳහා ඔවුන් විසින් සම්පාදනය කරගෙන ලැබ තිබූ විශ්ලේෂණයන් කෙතරම් දියුණු ඒවාද යන්න අපව විස්මයට පත් කරවන තරම් විය.

මේ තත්ත්වය තුළ යම් පිරිසක් කියා සිටියේ මෙම උභතෝකෝටිකය විසඳාලිය හැක්කේ මේ සියලු බලයන්ගේ මූලය එනම් පරමාධිපත්‍යය හිමි ජනතාව වෙත නැවත යාමෙන් බවයි. එනම් මහා මැතිවරණයකින් ජනතා අභිලාශයන් නිරූපණය වන අලුත් පාර්ලිමේන්තුවක් පත් කර ගැනීමකින් තොරව මෙම උගුලෙන් ගැලවිය නොහැකි බව ඔවුන්ගේ අදහස විය.[79]

---

76. 2018/11/24 සම්මුක සාකච්ඡාව, රත්නපුර ප්‍රදේශයේ තැනැත්තියක්.

77. 2018/11/16 සම්මුඛ සාකච්ඡාව, කොළඹ ප්‍රදේශයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක්.

78. 2018/11/23 සම්මුඛ සාකච්ඡාව, පානම ප්‍රදේශයේ තැනැත්තියක්.

79. 2018/11/06 සම්මුඛ සාකච්ඡාව, මොණරාගල ප්‍රදේශයේ තැනැත්තියක්, 2018/11/21 සම්මුඛ සාකච්ඡාව, බණ්ඩාරවෙල ප්‍රදේශයේ ත්‍රිරෝද රථ රියදුරෙක්, 2018/11/26 සම්මුඛ සාකච්ඡාව, පුත්තලම ප්‍රදේශයේ තැනැත්තෙක්, 2018/11/13 සම්මුඛ සාකච්ඡාව, මුලතිවු ප්‍රදේශයේ තැනැත්තෙක්.

පාර්ලිමේන්තුවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය නැවත වටයකින් ශක්තිමත් කිරීම සඳහා පරමාධිපත්‍ය බලය හිමි ජනතාව වෙත මහා මැතිවරණයක් මාර්ගයෙන් නැවත ගමන් කිරීම පිරිසක් යෝජනා කරද්දී තවත් පිරිසක් මහා මැතිවරණයක් අවශ්‍ය යැයි කියා සිටියේ පාර්ලිමේන්තුවේ බහුවිධ මතයන් යටපත් කරමින් තනි නායකත්වයක් වෙත බලය කේන්ද්‍රගත කිරීමට ජනවරමක් ලබාගනු පිණිසය. ඔවුන්ට අනුව ජනතාවගේ බහුතරයක් එවැනි නායකත්වයක් අපේක්ෂා කරති. ඒ අන් කවරෙකු හෝ නොව මහින්ද රාජපක්ෂ නමැති තනි පුද්ගල චරිතයයි. ඒ සඳහා වන මහින්ද රාජපක්ෂගේ කැරිස්මාව මූලික කොටගත් සියලු තර්කයන් ඉදිරිපත් වූයේ සිංහල ජනතාව වෙතින් පමණක් වීම සුවිශේෂීය.

> "මහින්ද මහත්තය තරම් චණ්ඩියෙක් මේ රටේ නායකකමට තාම පත්වෙලා නෑ. මොනව කළත් ඒ මිනිහ රට විකුණගෙන කෑවත් කාටවත් ප්‍රශ්නයක් නෑ. මේක එයා බේරගත්ත රට."[80]

> "පාර්ලිමේන්තුවේ ඔලුගෙඩි වලින් එහා මෙහා වුනාට ජනතාවගේ මතය මහින්ද මහත්තයට. දෙමළ මුස්ලිම් අයගේ බලය තමයි පාර්ලිමේන්තුව තුළ තීරණාත්මක වෙන්නේ."[81]

> "දෙමළ මුස්ලිම් බලපෑම් වලට නැවෙන්නේ නැතුව රට වෙනුවෙන් තීරණයක් එන්න නම් මහ මැතිවරණයකට යන්න ඕන."[82]

---

80. 2018/11/03 සම්මුඛ සාකච්ඡාව, බුත්තල ප්‍රදේශයේ පුද්ගලික ආරක්ෂක නිලධාරියෙක්.

81. 2018/11/23 සම්මුඛ සාකච්ඡාව, සියඹලාණ්ඩුව ප්‍රදේශයේ තැනැත්තෙක්.

82. 2018/11/10 සම්මුඛ සාකච්ඡාව, ගාල්ල ප්‍රදේශයේ සුළු ව්‍යාපාරිකයෙක්.

මෙම කවර පදනමකින් වුව පොදුවේ අවධාරණය කෙරුණේ පරමාධිපත්‍ය බලය හිමි ජනතාව මෙහි අවසාන තීරකයා විය යුතු බවයි. ඒ අනුව මෙවැනි දේශපාලනික මොහොතක ස්වකීය පුරවැසි වගකීම ජනතාව විසින් අරුත් ගන්වා ගනු ලබන ආකාරය විමසා බැලීම වැදගත්ය. ඒ පිළිබඳව අදහස් විමසීමේදී අප සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළ 143 දෙනාගෙන් 63 දෙනෙකුම (44%) මැතිවරණයකදී ස්වකීය ඡන්දය භාවිතා කිරීමෙන් ඔබ්බට ගිය පුරවැසි ක්‍රියාකාරීත්වයක් පිළිබඳව වන සිතීමක් ප්‍රකාශයට පත් නොකරන ලදී. බහුතරයක් දෙනා තමන් කැමැත්ත දක්වන දේශපාලන පක්ෂය හෝ දේශපාලන චරිතය බලයට පත් කිරීමෙන් ඔබ්බට ගිය කිසිදු අදහසක් ඉදිරිපත් නොකළහ.




එක්සත් ජාතික පක්ෂය විසින් සංවිධානය කළ
'යුක්තියේ ජනහඬ' ජන රැළිය.
උපුටා ගැනීම : **http://www.asianmirror.lk/news/**

"අපිට ඒ අය කිව්වොත් මේ විදියට කරන්න කියලා අපි ඒ දේ කරනවා. ඕනම දෙයක්. පෙළපාලියක් යන්න කිව්වොත් යනවා. ඡන්දයක් දෙන්න කිව්වොත් දෙනවා."[83]

83. 2018/11/03 සම්මුඛ සාකච්ඡාව, බුත්තල ප්‍රදේශයේ ආරක්ෂක නිලධාරියෙක්.

> "ඡන්දය දෙනවා ඇරෙන්න අපි කියලා වෙන මොනවා කරන්නද? බුලත් විටක් විකුණන්න මහන්සි වෙන අපි වෙන මොනව කරන්නද?" [84]

තවත් සැලකිය යුතු පිරිසක් මෙම අස්ථිර දේශපාලන තත්ත්වය තුළ සාමකාමීව සිටීම අවධාරණය කළ අතර තමන් සහාය දක්වන දේශපාලන පක්ෂය බලයට පත්වීමෙන් පසු කෙටි කාලීනව හෝ ආර්ථික ඇතුළු අනෙකුත් අසීරුතාවයන් දරාගනිමින් ඔවුන්ට සහාය දිය යුතු බව ප්‍රකාශ කොට සිටියහ. සමහරුන්ට අනුව මේ මොහොතේ වඩාත් ඥාණාන්විත තීරණය වන්නේ හැකිතාක් දේශපාලනයෙන් ඈත්ව සිටීමයි.[85] එමෙන්ම ජනතාවගේ නිද්‍රෝපගත හැසිරීම සම්බන්දයෙන් ස්වකීය කණස්සල්ල පළ කළ පිරිස් ද සිටි නමුත් ඔවුහුද ඊට ප්‍රතිපක්ෂ සක්‍රීය පුරවැසි ක්‍රියාකාරීත්වයක් පිළිබඳ අදහසක් පල කිරීමට අසමත් වූහ.

> "මෙච්චර කාලයක් අපේ උන්දලා බලාගෙන ඉන්න එකනේ කළේ. ඉස්සරහටත් එහෙමම තමයි."[86]

> "ලංකාව කියන්නේ ජීවත් වෙන්න හොඳ රටක් නෙවී. මේක දමල ගහල යන්න ඕන."[87]

> "අපේ රට පාලනය කරන්න අපේ අයට බැරි නම් වෙනත් රටකින් ඇවිත් බලෙන් හරි අපේ රට පාලනය කරන්න ඕන."[88]

---

84. 2018/11/06 සම්මුඛ සාකච්ඡාව, පොලොන්නරුව ප්‍රදේශයේ සුළු ව්‍යාපාරික කාන්තාවක්.

85. 2018/11/04 සම්මුඛ සාකච්ඡාව, කොළඹ ප්‍රදේශයේ පුද්ගලික අංශයේ සේවකයෙක්, 2018/11/03 සම්මුඛ සාකච්ඡාව, තලවතුගොඩ ප්‍රදේශයේ ශිෂ්‍යයෙක්, 2018/11/02 සම්මුඛ සාකච්ඡාව, රත්නපුර ප්‍රදේශයේ ආපනශාලා සේවකයෙක්.

86. 2018/11/05 සම්මුඛ සාකච්ඡාව, අනුරාධපුර ප්‍රදේශයේ ගොවියෙක්.

87. 2018/11/11 සම්මුඛ සාකච්ඡාව, මාතර ප්‍රදේශයේ තැනැත්තෙක්.

88. 2018/11/13 සම්මුඛ සාකච්ඡාව, කුරුණෑගල ප්‍රදේශයේ තැනැත්තෙක්.

මෙසේ ප්‍රකාශ වූ ජනතාවගේ කළකිරීමට හේතු ලෙස බොහෝ දෙනෙකු ඉදිරිපත් කර සිටියේ මෙරට ප්‍රධාන දේශපාලන පක්ෂ වල හැසිරීම සම්බන්ධයෙන් ඔවුන් තුළ වූ කළකිරීමයි. සමහරකු නව විකල්ප දේශපාලනයක් පිළිබඳව සිතීමට කාලය පැමිණ ඇතිය යන අදහස ඉදිරිපත් කළේ ද මේ පදනමිනි. නමුත් අපගේ පොදු නිරීක්ෂණයක් වූයේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, ජනතාවගේ පරමාධිපත්‍ය බලය පිළිබඳව වඩා දියුණු අදහස් දක්වූ පිරිස් පවා සක්‍රීය පුරවැසි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පැහැදිලි අදහසක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වූ බවයි. මෙහිදී වඩාත් කැපී පෙනුනේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ පාලනය තහවුරු කිරීම සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් දක්වූ අප සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළ උතුරේ හා නැගෙනහිර ජනයාගේ ප්‍රතිචාරයයි. ඔවුන්ට අනුව සක්‍රීය පුරවැසි ක්‍රියාකාරීත්වයක් යන්න ඔවුන්ට තවදුරටත් දැරිය හැක්කක් නොවේ. ඔවුන්ට අනුව යුද්ධය අවසාන වීමත් සමඟ ඔවුන්ගේ එකී හැකියාවද අවසන් විය. ඒ අනුව මේ තීරණාත්මක දේශපාලන මොහොතේ පුරවැසි වගකීම ඉටුකළ යුතුව ඇත්තේ සිංහල ජනතාව විසිනි. යාපනයේ දී අප සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළ එක් අයෙකු හැර සෑම අයෙකුම මෙය දුටුවේ දකුණේ සිංහල රාජ්‍යයේ අර්බුදයක් ලෙසිණි. එයින් එක් අයෙකු කියා සිටියේ 'සිංහල අය එකතු වෙලා සිංහල අය වෙනුවෙන් හදාගත්ත 19 වන සංශෝධනය ඒ අයම මේ විදියට විහිළුවට ලක් කරන කොට ඒ අය අපිට දේශපාලන විසඳුමක් දුන්න නම් ඒක කොහොම කඩල බිඳල දමාවිද'[89] යනුවෙනි. යුද්ධය නිමවී වසර 10 කට පසුවත් රාජ්‍යයේ අර්බුදයක් උතුරේ ජනතාවට තමාගේ දේශය නොවන වෙනත් දේශයක අර්බුදයක් ලෙස හැඟීයාම ගැඹුරින් සිතා බැලිය යුත්තකි.

89. 2018/11/14 සම්මුඛ සාකච්ඡාව, යාපනය ප්‍රදේශයේ තැනැත්තෙක්.

26 දින සිදුවීමට පක්ෂපාතීත්වය පල කරමින් මහින්ද රාජපක්ෂගේ බලයට පත් වීමෙන් උද්දාමයෙන් අදහස් දැක්වූ බොහොමයක් දෙනා පසුව එළඹි දේශපාලන සංකීර්ණතා තුළ ප්‍රකාශ කොට සිටියේ පාර්ලිමේන්තුවේ විකෘතිය වෙනුවට ජනතා අභිලාශය මහා මැතිවරණයක් හරහා ප්‍රකාශයට පත් කිරීමට අවස්ථාව දිය යුතු බවයි. නමුත් ඉතිරි වගකීම් සියල්ල මහින්ද රාජපක්ෂ විසින් ඉටුකරනු ඇතැයි යන විශ්වාසයෙන් ඔබ්බෙහි වන සක්‍රීය පුරවැසි ක්‍රියාකාරීත්වයක් පිළිබඳ අදහසක් ඔවුන් වෙතින් පල වූයේ නැත. ඒ සම්බන්ධයෙන් වූ ඔවුන්ගේ පිළිතුරු පවා ඉතා කෙටි හා නිශ්චිත විය. කුරුණෑගලදී අපට හමුවූ ත්‍රීරෝද රථ රියදුරෙකු එය මෙසේ සංක්ෂිප්ත කළේය.

> "අපිට කරන්න දෙයක් නෑ. මහින්ද මහත්තය ඉන්නෙ ඒකටනේ."[90]

## සමාප්ති සටහන

ඔක්තෝබර් 26 දින සිදුවීම විසින් මෙරට ජනතාව ඉතාම කෙටි කාලයක් තුළ පෙර නොදුටු විරූ දේශපාලනික හා නෛතික සංවාද ලෝකයකට අභිමුඛ කරවනු ලැබූ අතර එදින සිට මෙම ලිවීම ලියා අවසන් කරන ලද දෙසැම්බර් 15 වැනි දින දක්වා ගතවූ කාලය තුළ මෙරට ජනතාව ගෙවා දැමූයේ රික්තක නලයක් ඔස්සේ කාලය හරහා ගමන් කරන්නාක් මෙන් නම් නොවේ. ඔවුන්ගෙන් බහුතරයක් ඉතා සක්‍රීය ලෙසත්, විවේචනාත්මක ලෙසත් එකී සංසිද්ධීන් දෙස බැරෑරුම්ව කල්පනා කළහ; සංවාද කළහ. සමහර විටෙක එහිදී ඔවුන් වෙතින් පලවූ අදහස් මෙතරම් දේශපාලනිකව තීව්‍ර සිද්ධිදාමයක් තුළ

90. 2018/11/01 සම්මුඛ සාකච්ඡාව, කුරුණෑගල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ රියදුරෙක්.

මිස වෙනත් සාමාන්‍ය තත්ත්වයක් තුළ සිතා ගැනීමට පවා නොහැකි තරම් දියුණු ඒවා විය. වඩාත්ම වැදගත් දෙය වන්නේ මේ සියල්ල සමාජයේ අතිශයින්ම සාමාන්‍යය ගැහැණුන් හා මිනිසුන්ගේ සංවාදයන් තුළින් ඉදිරිපත් වීමයි. නමුත් එකී දියුණු දේශපාලනික අදහස් සක්‍රීය පුරවැසි භූමිකාවක් බවට පරිවර්තනය කර ගැනීමේ පරිකල්පනය හෝ සූදානම ඔවුන් වෙතින් එපමණටම ප්‍රකාශයට පත්වූයේ නැත. වැදගත් දේශපාලනික මොහොතක එකී සමකාලීනත්වය මඟහැරීම වළකනු පිණිසත්, ඉතිහාසයේ පාර්ශවකරුවන් එකී මොහොත තුළ සිදුවීම් වලට ප්‍රතිචාර දක්වන්නේ සහ අර්ථ නිෂ්පාදනය කරන්නේ කෙසේද යන්න විමසා බැලීමත් අරමුණු කර ගනිමින් දිවයිනේ තැනැත්තන් 143 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් සිදුකරන ලද මෙම අධ්‍යයනයේ සීමාකාරීත්වයන් පැවතිය හැකි වුවද දියුණු දේශපාලනික සමාජයක් සඳහා වන සක්‍රීය පුරවැසි භූමිකාව පිළිබඳව වන සංවාදය නම් අත්හළ නොයුතුය යන්න මෙතුළින් යළිත් වරක් ප්‍රකාශමාන වීය යන්න නම් කිසිසේත්ම බැහැර කළ හැක්කක් නොවේ. ■

**2018 ඔක්තෝබර් 26 සිදුවීම සහ අනතුරුව පාර්ලිමේන්තුව තුළ මෙන්ම ඉන් පිටත සිදුවූ සිදුවීම් වලට එරෙහිව ජනතාව සිය මහජන අවකාශය තුළ ප්‍රතිචාරය දැක්වූ අවස්ථා කිහිපයක්...**




ජනතා විමුක්ති පෙරමුණ විසින් 2018/11/01 දින නුගේගොඩදී සංවිධානය කළ ජන රැලිය.




සමරිසි ප්‍රජාව අපහාසයට ලක් කරමින් ජනාධිපතිවරයා විසින් සිදුකළ ප්‍රකාශයට එරෙහිව 'ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා සමනළයෝ' සංවිධානය විසින් 2018/12/07 දින පැවැත්වූ විරෝධතාවය.




'ශ්‍රී ලංකාවේ කාන්තාවෝ' සංවිධානය විසින් ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට 2018/11/28 පවත්වන ලද විරෝධතාවය.

'දිදුලන හදවත' සංවිධානය විසින් කොළඹ නගරයේ ස්ථාන කිහිපයක 2018/10/14 දින පවත්වන ලද නිර්මාණාත්මක විරෝධතාවය.







සිවිල් සමාජ සංවිධාන විසින් කොළඹ, ලිප්ටන් වට රවුමේ 2018/10/30 දින සිට සති කිහිපයක් පුරා දෛනිකව සිදුකළ විරෝධතාවය.

පුරවැසි සංවිධාන විසින් කොළඹ, නිදහස් චතුරස්‍රයේ 2018/12/19 දින පවත්වන ලද විරෝධතාවය.



“

ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේය.

\- 3 වන ව්‍යවස්ථාව,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව